

# විනිශ්චයට නැගී සිටුවීම

**(Raised to Judgement)**

- මයිකල් ඇෂ්ටන් විසිනි -

# විනිශ්චයට නැගී සිටුවීම

- මයිකල් ඇෂ්ටන් විසිනි -

# පටුන


| | |
|---|---|
| උත්ථානය සහ විනිශ්චය පිළිබඳ බයිබල් උගැන්වීම | 3 |
| ෆිලික්ස්ගේ අධිකරණයේදී | 3 |
| දූෂිත ශිෂ්ඨාචාරය | 4 |
| සදාචාර ප්‍රමිති - එදා සහ අද | 5 |
| හෙට මැරෙන මිනිසා | 6 |
| අමරණීයත්වයට තණ්හාව | 7 |
| යෝබ්ගේ විශ්වාසය | 8 |
| යෙසායාගේ විවරණය | 9 |
| දානියෙල්ගේ අනාවැකිය | 10 |
| මරණයේ නිද්‍රාව | 10 |
| මනුෂ්‍ය මිත්‍යා සහ බයිබල් සත්‍යය | 11 |
| ස්වාමින්වහන්සේ පැමිණීමේදී ජීවත්ව | 12 |
| ශාරීරික උත්ථානය | 14 |
| නැවත නැගිටුවනු ලබන්නෝ කවුරුන්ද? | 15 |
| සාධාරණ විනිශ්චයකරුවාණෝ | 15 |
| විශ්වාසවන්ත අනුගමනයේ මිහිරි දිමනාව | 16 |
| විනිශ්චයේ පදනම | 17 |
| මරණයේ ජීවිතයට | 18 |
| අවස්ථාවේ දවස | 19 |
| ප්‍රශ්න | 20 |

# විනිශ්චයට නැඟී සිටුවීම

## උත්ථානය සහ විනිශ්චය පිළිබඳ බයිබල් උගැන්වීම

යේසුස්වහන්සේගේ අපෝස්තුළුවරු, නිර්භීත සහ අත්‍යවශ්‍ය පණිවිඩයක් ඇතිව රෝමානු ලෝකය පුරා ගමන් කළහ. යේසුස්වහන්සේ මියගොස් තිබිණ. නමුත් උන්වහන්සේ මළවුන්ගෙන් උත්ථානය ලැබ දෙවියන්වහන්සේගේ දකුණු පාර්ශවයට උසස් කරනු ලැබීම, උන්වහන්සේගේ කීකරුකමේ උදාහරණය අනුගමනය කිරීමට උත්සාහ කරන්නන් සඳහා නව බලාපොරොත්තු දුන්නේය. සමච්චලය, පරිහාසය සහ පීඩාව නොතකා, මෙම අපෝස්තුළුවරු තමන්ගේ මහත් කාහල නාදය හැඬවූහ. ක්‍රිස්තුස්වහන්සේගේ උත්ථානය සියැසින් දුටු සාක්ෂිකරුවන්වූ ඔවුහු, ක්‍රියාවට පුබුදු වී යේසුස්වහන්සේගේ සියළු සැබෑ ගෝලයන්ට උරුම උත්ථානයේ බලාපොරොත්තුව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළහ.

මෙම පුදුම සහගත සහ සැනසිලිදායක ක්‍රිස්තියානි බලාපොරොත්තුව සහ ඒහා බැඳුනු මිනිසා පිළිබඳ දෙවියන්වහන්සේගේ විනිශ්චය ඉගෙනීමට, "අකලට උපන් තැනැත්තෙක්" (1 කොරින්ති 15 : 8). බඳුවූ , එම සාක්ෂිකාරයන්ගේ කණ්ඩායමට එක්වූ එක් අපෝස්තුළුවරයෙකුගේ දේශනා තුළින් විභාග කිරීමට වඩා යහපත් මාර්ගයක් සමහර විට තවත් නැත. ඔහුද දේශනාකළ දේ නිසා පීඩාවට සහ සිරභාරයට පත්වූ නමුත් අත්අඩංගුවේදී ද තම හදවත පිරවූ බලාපොරොත්තුව ගැන තමන් අත්අඩංගුවට ගත් අයට පවා නිහඬ කිරීමකින් තොරවම කථාකරගෙන ගියේය.

## ෆීලික්ස්ගේ අධිකරණයේදී

අගනුවර අලංකාරයට පිට, අධිරාජ්‍යයේ ඈත මුරපොළක, අපෝස්තුළු පාවුල් සිරකර සිටියේය. නමුත් සැකයකින් තොරව, එම සිරකුටිය කොතරම් අප්‍රසන්නව තිබුණත්, සිසෙරියාවේ ප්‍රාදේශීය ආණ්ඩුකාරයා, ෆිලික්ස්ගේ මූලස්ථානය, තම කලින් රෝමයේ ජීවිතයේදී දැන සිටි විලාසිතා නිවාසවලට යම් පමණ හෝ සමානත්වයක් ගන්නට ඇත. පුළුල් බලතල සහිතව තමන්ට අධිකරණයක් සාදාගත් හෙතෙම, මෑතදී සිංහාසනාරූඪවූ නීරෝ විසින් සමකර පසුව ඉක්මවා ගිය, ඕනෑ එපාවට සහ පරපීඩා කාමුකත්වයෙන් යුතුව, විනිශ්චය යැයි ආශාවෙන් සහ වැරදියට හැඳින්වූදේ බෙදා දුන්හ.

වයස දාහතරක් තරම් ළපටි වියේදී තම පියාවූ පළමුවෙනි හොරොද් අග්‍රිපා රජතුමාගේ නියෝගයෙන් සිරියානු රජුවූ අසිසස් හා විවාහවී පසුව ඔහුගේ මරණින් වැන්දඹුවූ, මහත් රූපශ්‍රීයෙන් යුතු තම තරුණ බිරිය ඩෲසිලා, ෆිලික්ස්ගේ සමීපයේ වූවාය. අසිසස්ගේ මරණයට බොහෝ පෙර සිටම අශිෂ්ඨ ෆිලික්ස් සමඟ ඇය පැවත්වූ සමාගමය නිසා ඇයගේ චරිතයේ ළපටි භාවය ඇයගේ වයසේ ළපටි භාවයට සමානවූවා දැයි සැක සිතුණු අතර, එය එම තත්වය අනුකූලනය කළේය. විවාහයේ ශුද්ධවූ භාවය ඉවතලා එම බැඳීම පිළිකුල් ලෙස සැලකීම හොරොද් පවුලේ ගතිලක්ෂණයක කොටසක්වූ ලෙස පෙනේ. තමාගේ සහෝදරයාගේ බිරිය පාවාගත් හෙරොද් ඇන්ටිපාස්, යොහන් බෞතිස්ත සිරභාරයට ගෙන පසුව හිසගසා මැරුවේ, ඔහු එයට විරුද්ධව විවේචනය කිරීමට බියනැතිවූ නිසා නොවේද? (මතෙව් 14 : 1-11)

## දූෂිත ශිෂ්ඨාචාරය

දූෂිත සහ අවකල් පුරුදු සහවා සිටින, ශිෂ්ඨාචාරය නම්වූ තුණී පටලය අපගේ නූතන 21 වැනි ශතවර්ෂයේ ලෝකයට සමාන්තරය එදත් අද මෙන්ම එහි මාර්ග ගැන විවේචනයට ප්‍රසාදයක් නොවීය. නමුත් මෙම පසුබිම යටතේ සහ මෙයට සම්බන්ධ ප්‍රමුඛයන් දෙදෙනා ඉදිරිපිට, සිරගත කරන ලද අපෝස්තුළුවර පාවුල් "ධර්මිෂ්ඨකමද, පමණ දැන ක්‍රියා කිරීමද, පැමිණෙන්නාවූ විනිශ්චයද ගැන කථා කළේය." (ක්‍රියා 24:25)

එම නිසා අප අද දවසේ එම ප්‍රතිපත්තිම විභාග කර, අප තුළත් අප කොටස්කරුවන් වන ලෝකය තුළත් වඩා උසස් චින්තන ප්‍රමිතීන් සහ හැසිරීම්වල අවශ්‍යභාවය හඳුනාගත යුතුය. එනු ලබන විනිශ්චය කාලයක් ගැන කථා කිරීම සුවපහසුවක් හෝ විලාසිතාවක් හෝ නොවේ. මෙම විෂයය, සංගීත ශාලාවන්හි විකට කථාවලට ලක්වූ, තිරාගින්න සමඟ පැටලුනු ධර්මය හා බැඳී වෙලී ඇත. නමුත් පෘථිවි ගැඹුරේ සදාකල් විඳවීමක් බයිබලයේ කිසිතැනක උගන්වන්නේ නැති නමුත් විනිශ්චය, අවසානයේදී ලෝකය උන්වහන්සේගේ මහිමයෙන් පිරියන දෙවියන්වහන්සේගේ සැලැස්මේ සමස්තය සඳහා අවශ්‍යයවූ කොටසක් ලෙස හඳුනාගත හැක.

පැරණි ෆිලික්ස් ලෙස, අප එම විෂයය අපගේ විඥ්ඥානයෙන් නෙරපා දමන්නට උත්සාහ කළත් එය සාර්ථක වන්නේ නැත. ඔහුගේ ජීවන මාර්ගයත්, ඔහුගේ අවසාන ඉරණමත් අතර තිබූ බැඳීම දුටු ෆිලික්ස් පවා වෙව්ලුවේය. "ශුද්ධකම නැතිව කිසිවෙක් ස්වාමින්වහන්සේ නොදක්නා වුවත්"

(හෙබ්‍රෙව් 12:4) තම මාර්ග වැඩි දියුණු කර ගැනිමට ෆිලික්ස් නොකැමති විය. අප කැමතිවුවාත් නැතත්, උත්සාහය සහ දිමනාව අතරත් කීකරුකම සහ දැඩුවම අතරත් සම්බන්ධතාවයක් ඇති බව අපගේ අත්දැකීම් අපට උගන්වයි. දරුවන්ගේ ශික්ෂණයේත් ආයතන කළමණාකාරයේත් මාර්ගෝපදේශක රීතිය එය වන අතර එය "කැරට් අලය සහ දණ්ඩ" ලෙස සම්පිණ්ඩනය කළ හැක. ෆිලික්ස් සහ ඩෘසිලා ඉදිරියේ සිටි එම අපෝස්තුළුවරයාගේ පහත සඳහන් වචන සලකා බලන්න :

"මක්නිසාද සියළු මනුෂ්‍යයන්ට ගැලවීම ගෙනෙන්නාවූ දෙවියන්වහන්සේගේ කරුණාව ප්‍රකාශ වී තිබේ. අභක්තිකමද ලෞකික තෘෂ්ණාද එපාකර ආශිර්වාද ලත් බලාපොරොත්තුව ගැනත් මහෝත්තම දෙවියන්වහන්සේගේද අපගේ ගැළවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේද තේජස ප්‍රකාශවීම ගැනත් බලා සිටිමින්, සිහියෙන් යුක්තව ද ධර්මිෂ්ඨකම් වලින් අප මුදා යහපත් ක්‍රියා ගැන ජ්වලිතවූ සෙනගක් ස්වකීය සම්පතක් කොට පවිත්‍රකරන්න පිණිස, අප උදෙසා තමන්ම දුන්සේක." (තීතස් 2:11-14)

එමනිසා උන්වහන්සේ උගැන්වූ ප්‍රමිති ගැන එකඟ වෙමින්, එය පිළිඹිඹු කරමින් ජිවත් විමට ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කිරීමට කැමති අප මත වගකීමක් පැවරී ඇත. උන්වහන්සේගේ නැවත පැමිණිම පිළිබඳ අප තුළ ඇති සංවේදිතාවයේ ප්‍රමාණයට දැන් "අදේව සහ ලෞකික ආශාවන් අත්හැරීම" අවශ්‍යයය. ෆිලික්ස් හට ප්‍රකාශ කළාවූ වචනවලට මේවා කොතරම් සමානද?

## සදාචාර ප්‍රමිති - එදා සහ අද

දෙවියන්වහන්සේගේ මාර්ගය අනුගමනය කිරීම (ධර්මිෂ්ඨකම) බොහෝ සේ ආත්ම දමනය හා බැඳී පවති. තමාගේ උපායයන්ට ඉඩහැරියහොත් මිනිසා විනාශවන තිරිසනුන් හා සමාන බැව් අපසැම පිළිගත යුතු වෙමු. (ගීතාවලිය 49:20) සමාජයේ නීතිය හා ආරක්ෂාව සහ කල්ලියක නීතිය අතර ඇති බෙදීමේ තුනිභාවය ගැන අපි නිරතුරුවම අසන්නෙමු. හොඳින් සකසන ලද සහ බුද්ධිමත් රෝමානු අධිරාජ්‍යය, ෆිලික්ස් සහ නීරෝ වැනි අය විසින් පහත් තත්වයට ඇද දමනු ලැබ, මුල් මිලේච්ජයන් සහ අනෙකුත් දෝෂනාම සහිත වනචාරීන්ගේ නොවැලැක්විය හැකි ගොදුරු බවට පත්විය. එම විලාසිතා මෙන්ම අපගේ සමාජයේ සදාචාර ප්‍රමිති කඩා වැටී අධිකාරීත්වයට ගෞරවය නොපෙනී යන්නේ නම්, අපගේ නගරවල මාවත් සටන් බිම් වී කලහ සහ බිය වැඩිවනු ඇත.

කොතැනකවත් ආත්මදමනයේ ගුණාත්මකභාවය හෝ ආත්ම සංයමය උත්කෘෂ්ඨ කර නැත. ඒ වෙනුවට එක් එක් මනුෂ්‍ය තෙමේ තම තමාගේ ඇස් හමුයෙහි හරිව තිබුණු දේ කරයි. (විනිශ්චයකාරයාගේ පොත 21:25) ඊශ්‍රායෙල් ඉතිහාසයේ තීරණාත්මක අවස්ථාවක එය සත්‍යය වුවා සේම, අදද එය සත්‍යයකි. සැබවින්ම, ප්‍රමිති නියමකර නැතිනම්, විනිශ්චයක්ද තිබිය නොහැකිය. හෝ ශුද්ධලියවිලි වචන පාවිච්චි කරන්නේ නම්, "ව්‍යවස්ථාවක්" නැති තැන වරද කිරීමකුත් නැත" (රෝම 4:15) දෙවියන්වහන්සේ විසින් ජීවිතයට පනවනලද අවශ්‍ය ප්‍රමිති කඩකිරීම සඳහා අප සමාජයට විනිශ්චය නමැති සිතුවිල්ල ප්‍රතික්ෂේප කිරීමට සිදුවිය. මෙවැනිම නොසැලකිලිමත්කමට නෝවාගේ දවස්වල ගංවතුරින් සහ කුණාටුවෙන් විනාශය ඉක්මන් කරගත්තාවූ ශිෂ්ඨාචාරය මෙන්, අපගේ යුගයේ සුලභ වැකි කඩක් වන්නේ "හෙට මැරෙන බැවින් කමු, බොමු" යන්නයි. (1කොරින්ති 15:32, මතෙව් 24:38, ලූක් 17:27)

ලෝකයේ නපුරුකම, පෘතුවිය මත උන්වහන්සේගේ විනිශ්චය මුදාහැරීමට හේතුවන බැව් දෙවියන්වහන්සේ විශේෂිතව වාර්තාකර ඇත. "මනුෂ්‍යයන්ගේ සියළු අභක්තියටද අධර්මිෂ්ඨකමටද විරුද්ධව දෙවියන්වහන්සේගේ උදහස ස්වර්ගයෙන් එළිදරව් වී තිබේ." (රෝම 1:18) කෙසේ නමුත් අපගේ විශේෂිතවූ අධ්‍යනය සලකන්නේ සුභාරංචි පණිවුඩයට අපගේ පෞද්ගලික ප්‍රතිචාරයන් ක්‍රිස්තුස්වහන්සේගේ ආසන්නවීමට ඇති විනිශ්චය ආසනයත්ය.

## "හෙට මැරෙන බැවින්"

අපගේ ක්‍රියා සඳහා කිසිකෙනෙකුට වගකීමක් නොදැක්වීමේ ආකල්පය විශාල ලෙස ව්‍යාප්තය. සිත් ඇදගන්නා ලෙස, කෙසේ නමුත්, අපොස්තුළුවර පාවුල් එය විස්තර කරන විට, ඔහු එය උත්ථානය ගැන අවිශ්වාසයට සම්බන්ධ කරයි.

මට ඇති ප්‍රයෝජනය කුමක්ද? මළහු නොනැගිටින්නෙම්, හෙට මැරෙන බැවින් කමු, බොමු" (1 කොරින්ති 15 :32)

එවිට පැහැදිළිවම, මළවුන්ගෙන් නැවත නැගිටීමේ පොරොන්දුව, අපගේ ජීවිත අප ගෙනයන ආකාරයට බලපෑ යුතුය. එය, උන්වහන්සේගේ මාර්ග සහ පනත් තම ජීවිත තුළ දැන් පිළිපදින්නට උත්සාහ කරන්නන් හට දෙවියන්වහන්සේ පොරොන්දුවූ දීමනාවයි. එමනිසා මරණයේදී මිනිසාට ඇත්තේ කුමන බලාපොරොත්තුවක් දැයි තේරුම් ගැනිම අවශ්‍යය.

සොලමන්, දේශනාකාරයා නම්වූ පොතේ, මිනිසාගේ ක්‍රියා සහ ඒවායේ අන්තිම වටිනාකම සමාලෝචනය කරමින් මෙසේ පවසයි.

"සියළුදේ සියල්ලන්ට ඒකාකාරයෙන් සිදුවන්නේය. ධර්මිෂ්ඨයාට සහ දුෂ්ඨයාටත්............ ඒකාකාරය" (දේශනාකාරයා 9:2)

මරණයේ ස්වභාවය ගැන ඔහුගේ විස්තර කිරීම එසේම ලුහුඩුය. "මක්නිසාද, ජීවත්වන්නෝ තමුන් නසින්ට ඕනෑ බව දනිති. මළාහු කිසිවක් නොදනිති. ඔවුන්ට තවත් කිසි විපාකයක් නැත. මක්නිසාද, ඔවුන් සිහිවීම නැතිවිය." (දේශනාකාරයා 9:5)

මෙම අවසන් කණ්ඩය සමහර විට සිතුවිලි දෙකක් හඟවයි. එක් අතකින්, කාලය ගතවීමෙන් මිය ගිය අය සමීප මිතුරන්ට හා හඳුනන අයට අමතක වේ. නමුත් මරණයේදී, කෙනෙකුගේ මතකයද, නැතිවේ. එය, ශක්තිය තිබෙන්නාක් කල් පමණක් මතක කාර්යය තිබෙන සාක්කු කාල්කයුලේටරයක් මෙනි. ශක්තිය වසා දැමූ විට, ගණනය කිරීමට, මතකයෙන් ගෙන ඒමට හෝ අනෙකුත් ක්‍රියා විදහා දැක්වීමට ඇති බලය ඉවත් කරනු ලැබේ. අකීකරුකමින් පසු ආදම්ට දුන් වචන එළිදරව් කරන සේ, මරණයේදී මිනිසාගේ තත්වය මෙයයි.

"නුඹ භූමියෙන් ගන්නා ලද, බැවින් එයට හැරියන තෙක්ම........ නුඹ දූවිලිය, දූවිල්ලට හැරී යන්නේය." (උත්පත්ති 3 : 19)

## අමරණීයත්වයට තණ්හාව

සැබැවින්ම සත්‍යයක් නොවේ යැයි බලාපොරොත්තු වෙමින්, මිනිසුන් සහ ගැහැණුන් විසින් ප්‍රතික්ෂේප කරන්නට කැමතිවන සත්‍යය මෙයද? එක් කෙටි දිනක් පමණක් ජීවත්වන සමනළයෙකු මෙන්, අස්ථිර ප්‍රාණයෙකුසේ අප ගැන සිතීමට කිසිවෙකු ඇත්තටම කැමති නැත. එහෙත් ඉතිහාසයේ පුළුල් සියවස් ගණනාවට එරෙහිව සත්‍යය මෙයයි. ජීවිතය නැමැති වීලේ අපගේ පෞද්ගලික රැළි ඉටුකරගන්නේ සුළු දෙයක් පමණි. ලෝකය මහත් තත්වය ආරෝපණය කරන ලද, මිනිසුන් පවා මිනිසාගේ කටයුතු මාලාව සම්බන්ධව කරන්නේ ඉතා සුළු වෙනස් කිරීම් කිහිපයක් පමණි. නමුත් අප සියල්ලන් තුළම අමරණීයත්වයට ආශාවක් ඇත - එනම් අපට පසු යමක් ඉතිරිකර යෑමටය. තමාගේ දරුවන් තුළ තම ජීවිතවල අංශයන් සදාතනිකව පවත්වාගෙන යෑම දෙමාපියන් දක්නා අතර, විටෙක තමන්ගේ දරුවන් තුළ තම ජීවිතය නැවත ජීවත් කරවීමට උත්සාහ කිරීමෙන් එම දරුවාගේ ජීවිතය හානිවී ඇත. මිනිසාගේ නොමැරෙන අත්‍යාවශ්‍යය කොටසක් තුළ විශ්වාස පළකිරීමට හේතුව සමහර විට මෙම ආශාව වන්නට පුළුවන.

මෙය ඒදන් උයනේ පරීක්ෂාවේදී පළමුවෙන් මතුරන ලද මුසාවකි. "නුඹලා ඇත්තටම නසින්නේ නැත." (උත්පත්ති 3:4) ගිලී ගිය නැවක පන බේරා ගත්තෝ, පවතින ඉතාම සුළු පාවෙන යමක නැගී ප්‍රචණ්ඩ සාගරය ජයගන්නට උත්සාහ කරන්නාසේ, බොහෝ අය දැඩිලෙස වැළඳගෙන සිටින්නාවූ මහා අසත්‍යය මෙයයි. එය අසත්‍යයකි. අප අපටම අවංක වන්නට අවශ්‍යය නම්, අප එය අතහැර දමා ස්ථිර සහ නොසැලෙන දේවල් කෙරෙහි "ස්ථිරවූ තිරයෙන් ඇතුලට යන්නාවූ නැංගුරමක් මෙන්" අපගේ විශ්වාසය තැබිය යුතුය (හෙබ්‍රෙව් 6 : 19)

## යෝබ්ගේ විශ්වාසය

ජිවිතයේ අත්දැකිම් කියාදුන් පාඩම්, අන් අයගේ යහපත උදෙසා බෙදා දමට හැකිවීමට හේතුවන සදාකාලයට වූ ප්‍රාර්ථනාව. විරල නොවේ. යෝබ්ගේ පොතෙහි, එම සාධාරණ මිනිසාගේ විඳවීම ඔහුගේ විශ්වාසයේ පදනම් කරා තියුණු වූ විට, ඔහු මෙසේ මොර දුන්නේය.

> අනේ මාගේ වචන දැන් ලියනු ලැබුවොත් කොපමණ හෙඳද! ඒවා පොතක සටහන් කර තබන්නට යකඩ පන්හිඳකින් හා ඊයම් වලින් සදාකාලේටම පර්වතයෙහි කොටා තබන්ටත් යෙදුනොත් කොපමණ හොඳද ! (යෝබ් 19 :23-24)

එවැනි මොරගැමක් යෝබ් වැනි මිනිසෙකු කිරීම, ඔහු දන්වා සිටීමට තිබූ පණිවිඩය වැදගත්වන්නට ඇත. පිළිකුල් සහගත වසංගතයකින් ඔහුට පහරදී තිබුණි. එය ජිවත්වන මරණයක් විය. සෑම උදයකම අවදිවන ඔහු මරණයේ නිශ්ඩාව සහ ජිවිතයේ නිරර්ථක භාවය ගැන භාවනා කළේය. මෙය ඔහු සඳහා උත්තරීතර බලාපොරොත්තුවක් නිශ්චිත කළ අතර, මතු පරම්පරාවල් සඳහා ආරක්‍ෂා කිරීමට ඔහු කැමති වූයේ මෙයයි. විපත්තිය කෙරෙහි ඔහුගේම නොසැලිම තහවුරු කිරීමක් විය.

> "මාගේ මිදුම්කාරයාණන් ජිවත්ව සිටින බවද අන්තිමේදී උන්වහන්සේ පොළොව පිට සිටින බවද දනිමි. මේ මාගේ හම නැතිව ගියායින් පසු, මාගේ මාංසය නැතුව නමුත් දෙවියන්වහන්සේ දකින්නෙමි. මමම උන්වහන්සේ දකින්නෙමි. අන්‍යයෙක් නොව මාගේම ඇස් උන්වහන්සේ දකින්නේය. මාගේ හෘදය වස්තුව මා තුළෙහි ක්ෂය වී තිබේ." (යෝබ් 19 : 25-27)

මෙය ඔහුගේ අසනීපයේ වේදනාව තුළින් මිරිකාගන්නා ලද දැහැමි ගතානුගතියක් නොවන බැව් දෙවියන්වහන්සේ විසින්ම සහතික කිරීම, යෝබ් පොතෙහි පසුව කරන ලද වාර්තාවෙන් පෙනේ. උන්වහනසේ යාකොබ්ගේ මිතුරන්ට මෙසේ පවසයි.

"<u>මාගේ සේවකයාවූ යෝබ් මෙන්,</u> නුඹත්......... මා ගැන හරිලෙස කථා නොකළ බැවින්", (යෝබ් 42:7)

දෙවියන්වහන්සේ ගැන යෝබ් කථා කළ හරි දේ අපට වැදගත්ය. පවුකාර මිනිසුන් හා ස්ත්‍රීන් මුදවා ගැනීමට හැකි දෙවියන්වහන්සේගේ සජීවී බලය ගැන ඔහු කථා කළේය. එම මුදවා ගැනීම සම්බන්ධව, ඔහු ගැන දෙවියන්වහන්සේගේ විනිශ්චය දැකීමට සහ ඇසීමට ඔහු සිටිනු ඇතැයි බලාපොරොත්තුව ඔහු ප්‍රකාශ කළේය. නමුත් සොලමන් විස්තර කළ පරිද්දී, මරණයේ ස්වභාවය යෝබ් තේරුම් ගත්තේය. ඔහු තම ශරීරයේ දිරායාම ගැන කථා කළ අතර, දිනෙක දෙවියන්වහන්සේ ඉදිරියේ එම ශරීරයම සිටිනු ඇතැයි ද විශ්වාස කළේය.

## <u>යෙසායාගේ විවරණය</u>

මෙම ප්‍රකාශය කළ එකම පැරණි ගිවිසුම් තැනැත්තා යෝබ් වූයේ නම්, එම සාක්ෂිය ඉවත දැමීම සඳහා අපට සමාවක් තිබුණි. නමුත් සිටියේ ඔහු පමණක් නොවේ. යෙසායාගේ අනාවැකියේ, අප දේශනාකාරයා සහ යෝබ්ගෙන් ඉගෙනගන්නාවූ දෙය නැවත කියනු ලබයි. 26 පරිච්ජේදයේ 13 සහ 14 පදවල මරණයේ ස්වභාවය ගැන ඇති විස්තරය පළමුවෙන් සලකා බලන්න.

"අපේ දෙවිවූ ස්වාමීන්වහන්ස, ඔබ හැර වෙන ස්වාමිවරු අප ආණ්ඩු කළෝය......... මළාහු ජීවත්නොවන්නෝය. නැසීගියාවූ ඔවුහු නොනැසී යන්නෝය. එසේය, ඔබ ඔවුන් විමසා බලා ඔවුන් විනාශකොට ඔවුන් ගැන මුළු සිහිවීම නැතිකළ සේක."

පුන පුනා කීමෙන්, මෙම මිනිසුන්ගේ ඉරණම නොවැලැක්විය හැකි වූවා සේය. "මළාවූ" සහ "නැසීගිය", ඔවුන් "ජීවත්වන්නෝත්", "නැගිටින්නෝත්" නොවෙති. සොලමන් කියූ පරිද්දී : "ඔවුන්" ගැන සිහිවීම නැතිවිය. කෙසේ හෝ ප්‍රතිවිරෝධීව, මෙම බලාපොරොත්තු රහිත භාවය වෙනුවට දෙවියන්වහන්සේගේ ජනතාවට මෙම තත්වය ඇත.

"ඔබගේ මළහු ජීවත්වන්නෝය. මාගේ මළකඳන් නැගිටිනවා ඇත. ධූලියෙහි වසන්නනි, පිබිදී ගී කියාපල්ලා. මක්නිසාද ඔබගේ පිනි පලාජාතිවල පිනි මෙන්ය. පොළව සහ මළවුන් පිට ඔබ ඒවා බසින්ට සලස්වනසේක." (යෙසායා 26 : 19)

එමනිසා අප ඉගෙනගෙන ඇත්තේ, සමහර අයට එය සැබවින් අවසන් අවස්ථාව වුවත්, අනෙත් අය සඳහා මරණයේ ස්වභාවය - එසේම සම්පූර්ණ අවිඥානික භාවය, "සියල්ලෝ මත පැමිණෙන දෙය" වුවත් - නැගිටුවීමේ බලාපොරොත්තුව හෝ පෘතුවියෙන් පිටතට දැමීම ඇති බවය.

## දානියෙල්ගේ අනාවැකිය :-

දානියෙල්ගේ අනාවැකිය මෙම වර්ගීකරණය තව පියවරක් ඉදිරියට ගෙනගොස් දෙවැනි කණ්ඩායම - දෙවියන්වහන්සේගේ ජනතාව - තවම නොදන්නා ඉරණමකට නැගිටීම පෙන්වයි. අප බලන්නට බලාපොරොත්තු වන පරිදි, පාවිච්චි කරන ලද වචන තීරණාත්මකව වැදගත්ය.

"පොළවේ ධූලියෙහි සැතපෙන්නන් ගෙන් බොහෝ දෙනෙක් (සියල්ලෝම නොවේ) , සමහරක් සදාකාල ජීවනයටත් සමහරක් නින්දාව සහ සදාකාල නිවකමටත් පිබිදී එන්නෝය." (දානියෙල් 12:2)

මෙම විෂයයේ ශුද්ධලියැවිලි භාෂාව මෙය බැව් අපගේ අධ්‍යයනය තුළින් අපි හොඳහැටි දන්නෙමු. "පොළවෙහි ධූලි, ආදම්ගේ, ඒවගේ සහ ඔවුන්ගේ පැවතෙන්නන්ගේ ඉරණම පිළිබඳ උත්පත්ති කථාවේ දෝංකාරයයි. පැහැදිලිවම, සදාකාල ජීවිතය ඉරණම් කරගත් අය සහ සදාකාල පිළිකුල හා නිවකම සඳහා වූ අය අතර වෙනස් කිරීමක් තිබිය යුතුය.

## මරණයේ නිද්‍රාව

පසුව නැගිටවන්නාවූ මිය ගිය අය සඳහන් කරන අනෙකුත් ශුද්ධ ලියවිලි පදවලට සමානව, ඔවුන් "නිදාගන්නා" ලෙස දානියෙල් පවසයි. එක් අවස්ථාවකදී, තම දියණිය මිය ගිය සිනගෝගයේ නායකයෙකුගේ නිවසට යේසුස්වහන්සේ කැඳවාගෙන ගිය අවස්ථාවේ, "යෞවනිය මැරිලා නොව නිදන්නීයයි" (මතෙව් 9 : 24) උන්වහන්සේ අනාවරනය කළ විට, එතැනට රැස්වූ වෘත්තිමය වැළපෙන්නන් විසින් උන්වහන්සේට සිනාසෙන ලදී. ශුද්ධ

ලියවිලි වල නියම අර්ථය ඔවුන් දැන සිටියා නම්, මෙම භාෂාව යේසුස් වහන්සේගේ අරමුණ ඇය මළවුන්ගෙන් නගාසිටුවීම ස්ථිර කිරීම බැව් තේරුම් ගත යුතුව තිබුණි. එමනිසා මෙය උන්වහන්සේ උත්ථානය කිරීම සඳහා අදහස් කරන්නන් දෙස දෙවියන්වහන්සේ බලන ආකාරය වේ. උන්වහන්සේ සඳහා මහා ධර්මිෂ්ඨ දවස උදාවෙද්දී නැවත ඇහැරීමේ කැඳවීම බලාපොරොත්තුවෙන් ඔවුහු හිඳිති.

**ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ තවත් ප්‍රකාශයකට දානියෙල්ගේ වචන සම්බන්ධය :**

> "මක්නිසාද පියාණන්වහන්සේ තමන් තුළම ජීවනය ඇතුව සිටින්නාක් මෙන් පුත්‍රයාටත් තමන් තුළම ජීවනය ඇතුව සිටින්නට උන්වහන්සේ වරය දුන්සේක. ඔහු මනුෂ්‍ය පුත්‍රයා බැවින් විනිශ්චය කරන්ටද බලය දුන්සේක. මේ ගැන මවිත නොවෙල්ලා. මක්නිසාද සොහොන් ගෙවල්හි සිටින, සියල්ලන්ට ඔහුගේ හඬ ඇසෙන පැය පැමිණ. යහපත්කම් කළාහු ජීවනයේ නැවත නැගිටීමටත් නපුරුකම් කළාහු විනිශ්චයේ නැවත නැගිටීමටත් පිටත්ව එන්නෝය." (යොහන් 5 : 26-29)

නැවත නැගිටීම පොදුවේ සාකච්ඡා කරන විෂයයක් නොවේ. මරණින් පසු සිදුවන සංකල්ප බොහෝ පරස්පර විරෝධී න්‍යායයන් පරාසයක් අතර ඇත. සමහරු, මෙම පෘතුවියේ සහ ජීවිතයේ බාධාවන්ගෙන් නිදහස් නමුත් අර්ථ රහිත පැවතීමක් ගැන සෙනෙහෙවන්තව සිතත්, සමහර විට එවැනි ඉරණමක් මැවුම්කරුවාට හෝ මවනු ලබන්නාට කුමන ප්‍රීතියක් දෙන්නේ දැයි අසිය යුතුය. මෙම දයුන හා සමගාමීව ඇවිලෙන ගින්න සහ ගෙන්දගම් සහිත දුමින් පිරී සදාකාල වධ වේදනාවක් ඇත. මෙම අදහස් දෙකටම පොදුවේ ඇත්තේ අපගේ වර්තමාන මැරෙන සුළු ශරීරවලින් නිදහස් වීමයි.

අපගේ ඉරණම කුමක් වුවත්, එහි සහභාගීත්වය (එසේ කියන ලද්) අමරණීය යැයි සිතාගන්නා කොටස සමහය. - පොදු හැඳින්වීම යොදන්නේ නම් අත්‍යවශ්‍යය පුද්ගලභාවය හෝ "ආත්මය" වේ.

## <u>මනුෂ්‍ය මිත්‍යා සහ බයිබල් සත්‍යය :-</u>

අපගේ බයිබල් ඉගැන්වීම් සමාලෝචනයෙන්, මෙම නොපැහැදිළි අදහස්වලට පදනමක් නොමැති බැව් දනිමු. ඒ වෙනුවට, සරල භාෂාවෙන්, මනුෂ්‍යයාගේ සැබෑ තත්වය සහ මුදවා ගැනීමේ දෙවියන්වහන්සේගේ ක්‍රියාවලිය සම්බන්ධව බලවත් සහ අවධානය කරන්නාවූ සත්‍යයක් ඇත.

1. මනුෂ්‍යයා මරණීය ස්වභාවයෙන් උපත ලබයි. ආදම් දක්වා සියළු මිමුත්තන්ගේ ස්වභාවය ගන්නාවූ මැරෙන සුළු ජීවියෙක්.

2. මනුෂ්‍යයා පවුකාරීය, සියළු මනුෂ්‍යයෝ පොළඹවනු ලබන අතර, ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හැර, දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව කඩමින් පවු කරත්.

3. අසනීපයෙන්, අනතුරින්, ඝාතනයෙන් හෝ වයසින් සියළු මිනිසුන් මිය යයි.

4. මරණය යනු පූර්ණ අවිඥානක තත්වයයි. ශ්වසනයෙන් තව දුරටත් ශක්තිය නොලැබ, එය සෑදූ පෘතුවියේ මූලද්‍රව්‍ය වලට ශරීරය දිරා පත්වේ.

5. උන්වහන්සේ සහ උන්වහන්සේගේ ව්‍යවස්ථාව දන්නා සියල්ලන් දෙවියන්වහන්සේ මළවුන්ගෙන් නැගිටුවන සේක.

6. පෘතුවියට උන්වහන්සේගේ පැමිණීමේදී, ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසින් නැවත නැගිටුවන ලද අය දෙවියන්වහන්සේ විනිශ්චය කරනවා ඇත. සමහර අය හට අමරණීයත්වය ප්‍රධානය කරනවා ඇත. ඉතිරි අය සදාකාලයටම තම සොහොන් තුළට නැවත යනවා ඇත.

7. අමරණීය කරවන ලද අදහන්නෝ, සාන්තුවරයෝ හෝ ශුද්ධත්වයට පත් කළ අය, පෘතුවිය මත දෙවියන්වහන්සේගේ රාජ්‍යය ක්‍රිස්තුස්වහන්සේ සමඟ පාළනය කරමින් ජීවත්වනවා ඇත.

## ස්වාමීන්වහන්සේ පැමිණීමේදී ජීවත්ව

මෙම වැඩසටහනෙහි, ක්‍රිස්තුස්වහන්සේ නැවත එනවිට ජීවත්ව සිටින්නන් හට විශේෂ සැලසුම් යොදා ඇත. උත්ථානයත් විනිශ්චයත් ගැන උගැන්වීම් තේරුම් ගන්නට හැකිවූ, නමුත් එය සිදුවන්නේ දැනට මිය ගිය අයට පමණක් යැයි සිතූ අදහන්නන් හට මෙය මහා සැලකිල්ලට ලක්වූ කාරණයක් විය. මෙය පැහැදිලි කිරීමට බොහෝ අවස්ථාවන්හිදී නව ගිවිසුම් ලේඛකයන් අනුභාවික විය. ඔවුන් එසේ කළාට අප ස්තුතිවන්ත විය යුතුයි. මක්නිසාද, දෙවියන්වහන්සේ නියම කරන ලද මහා පැමිණීම පෘතුවියේ ව්‍යසනවල වැඩිවීම සලකුණු කරන්නේය. "තමන්වහන්සේ විසින් පත් කළ මනුෂ්‍යයා ලවා ලෝකයා ධර්මිෂ්ඨකමින් විනිශ්චය කරවන්ට එක් දවසක් නියම කර තිබේ. උන්වහන්සේ ඒ මනුෂ්‍යයා මළවුන්ගෙන් නැගිටවීමෙන් සියල්ලන්ට ඒ

ගැන සහතිකයක් දී තිබේ." (ක්‍රියා 17:31) එමනිසා අප උන්වහන්සේගේ දිව්‍යමය රාජ්‍යයේ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බලයෙන් අරමණීය පාලිතයන් වී "නින්දට" (මරණයට) පත් නොවී, වෙනස් කරනු ලබන පරම්පරාවේ සාමාජිකයන් වන්නට පුළුවන.

ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පැමිණීමේදී, සත්‍යයේ සුභාරංචියට කුමන හෝ ප්‍රතිචාරයක් දීමට තීරණය නොකළ මිනිසුන් සහ ගැහැණුන් (විශේෂයෙන් දරුවන්) සිටිනු ඇත. "ශික්ෂාව සියොන් කෙරෙන්ද ස්වාමීන්වහන්සේගේ වචනය යෙරුසලමෙන්ද නිකුත්වන" (මීකා 4 : 2) කාලය තුළ ඔවුන් ජීවත්වනු ඇත. ක්‍රිස්තුස්වහන්සේගේ ධර්මිෂ්ඨ පාලනය නිසා ලෝකයේ තත්වය වර්ධනය වී ජීවිතයේ බලාපොරොත්තු වැඩිවනු ඇත. සමහර විට ජලගැල්මට ප්‍රථම කාලයට සමානවූවා සේය.
යෙසායා අනාවැකි පවසයි :

"දවස් ගණනක ළදරුවෙක් වත්, වයස් නොපිරුණු මහල්ලෙක්වත් එතනින් තවත් තුරන්දු නොවී, බාල දරුවා අවුරුදු සියයක්, වයස්ව නසිනවා ඇත. නමුත් අවුරුදු සියයක් වයස්වූ පවුකාරයා ශාප ලබනවා ඇත." (යෙසායා 65 : 20)

නමුත් සෑම දරුවෙක්, තරුණයෙක් සහ මහල්ලෙක් තමන්ගේ නියමිත වේලාවට මිය යන්නෝය. ක්‍රිස්තුස්වහන්සේගේ මෙම රාජ්‍ය කාලය අවසානයේ දෙවැනි නැගිටවීමක දවසක්, දෙවැනි විනිශ්චයක් සහ තමන්ගේ නාම "ජීවන පොතේ ලියා ඇති" අමරණීයත්වය ප්‍රධානය නොකළ අය සඳහා දෙවැනි සහ නිරපේක්ෂ මරණයක් තිබෙනු ඇත. (එළිදරව් 20 : 12-15)

යේසුස්වහන්සේ නැවත පැමිණීමේදී සාමය සහ ධර්මිෂ්ඨකම හඳුන්වා දෙන යුගය අප ජීවත්වන පෘතුවියට සම්බන්ධ වනවා සේ , බයිබලයේ ප්‍රකාශ කරන ලද උත්ථානයද ශාරීරික එකකි. යේසුස්වහන්සේගේම උත්ථානය විභාග කිරීමෙන් පෙන්වා දෙන පරිදි, ඈත ස්ථානවල ආත්මීය ලෝකයක අපහැදිලි මතයක් නොමැත. පළමුවෙන්ම, මරිය මග්දලේනා විසින් උන්වහන්සේ උයන්පල්ලා ලෙස වැරදියට හඳුනාගත් අතර, උන්වහන්සේ ස්පර්ශ කිරීමට උත්සාහ කිරීමේ දී ඇයට තරවටු කිරීමටද සිදු විය. "මට අත නොගසන්න. මක්නිසාද මම තවම පියාණන්වහන්සේ වෙතට නොනැංගෙමි" (යොහන් 20:15-17) පසුව, උන්වහන්සේගේ කුරුසියත වීමෙන් තමාහට අත්විය හැකි ප්‍රතිවිපාක ගැන බියෙන්, ඉහළ මාලයේ උන්වහන්සේගේ ගෝලයෝ රැස්ව සිටි විට යේසුස්වහන්සේ දර්ශනය වූ අතර, ඔවුහු තමන් අවතාරයක් දකිනා

බව සිතූහ. ඔවුන්ගේ බියසුළුකමට යේසුස්වහන්සේ දුන් පිළිතුර මෙම කරුණ සැකයකින් තොරව විසඳයි.

> නුඹලා කැළඹෙන්නේ මක්නිසාද? නුඹලාගේ සිත්වල ශංකා හටගත්තේ මක්නිසාද? මාගේ අත්පා බලා, ඒ මමම බව දැන ගනිල්ලා. මා අතගා බලාපල්ලා. මක්නිසාද මස් හා ඇට තිබෙනවා නුඹලාට පෙනෙන ලෙස ආත්මයකට (අවතාරයකට) නැත" (ලූක් 24:38,39)

## ශාරීරික උත්ථානය

එමෙන්ම, ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පැමිණීමේදී උත්ථානය, ශරීරික එකක් වන්නේය. "සොහොන් ගෙවල්හි සිටින සියල්ලන්ට ඔහුගේ හඬ ඇසෙන....... පිටත්ව එන්නෝය" (යොහන් 5 : 28) දිරාගිය ශරීර නැවත නඟා සිටුවීමට සියළු දේ මැවූ දෙවියන්වහන්සේට ඇති හැකියාව ප්‍රශ්න කිරීම නිෂ්ඵලය. මක්නිසාද උන්වහන්සේ පළමුවෙන්ම පොළවෙහි දූවිල්ලෙන් මනුෂ්‍යයා සෑදූ අතර, එමනිසා උන්වහන්සේගේ අසීමිත බලය තුළ විශ්වාස කරමින් තමන් දූවිල්ලට හැරී ගිය බොහෝ මිනිසුන් සහ ස්ත්‍රීන් නැවත සෑදීමේ හැකියාව උන්වහන්සේට ඇත.

උත්ථානයේ කාලයත්, ආදම්ගේ අත්දැකීමට විනිශ්චයත් අතර සමානත්වය අනාවරණය කරන සුළුය. ඔහු අමරණීයව මවනු නොලැබීය. දෙවියන්වහන්සේ හෝ ඔහුගේ ආශාවන් හට කීකරුවීමට තෝරා ගැනීම හෝ ඔහු ඉදිරියේ වූ අතර, සියළු මනුෂ්‍ය වර්ගයා පසුව අනුගමනය කළ යුතු සැලැස්ම ඔහු විසින් තෝරා ගන්නා ලදී.

එමනිසා ඔහු දෙවියන්වහන්සේ විසින් "විනිශ්චය" කරනු ලැබීය. "නුඹේ භාර්යාවගේ හඬට ඇහුම්කන්දී....... බැවින් භූමිය ශාපලද්දීය....... භූමියෙන් ගන්නා ලද බැවින් එයට හැරී යනතෙක් නුඹේ මුහුණේ ඩහදියෙන් යුක්තව කෑම කන්නෙහිය" (උත්පත්ති 3 :17-19)

එමනිසා සියල්ලට ප්‍රථම, උත්ථානය අදහස් කරන්නේ එම වචනයම හඟවන දෙයයි. නැගිටවීමක් හෝ සිටුවා ගැනීමක් : වහාම වෙනස් වූ ස්වභාවයක් නොව, නමුත් විනිශ්චයට මුහුණදීමට සූදානම් නැවත සකස්කරන ලද මැරෙන සුළු ශරීරයක්ය. "ආදම්ගේ වරද කිරීමේ ආකාරයෙන්" (රෝම 5 : 14) පවු කිරීම දිගටම කරගෙන යනු ඇත. අනෙක් අය උන්වහන්සේගේ මරණය සහ නැවත නැගිටීමේ ජයග්‍රහණය හඳුනාගෙන දෙවියන්වහන්සේගේ පුත්‍රයාගේ ආදර්ශය අනුගමනය කිරීමට උත්සාහ ගනු ඇත.

## නැවත නැගිටුවනු ලබන්නෝ කවුරුන්ද?

ස්වාමිවූ යේසුස්වහන්සේගේ ක්‍රියාව තුළින් කිරීමට පොරොන්දුවූ ජීවිත දීමනාව නොදැන සහ දෙවියන්වහන්සේගේ අභිප්‍රායාත්මක බලය ගැන අවධානයක් නොමැතිව බොහෝ අය තම ජීවිත ගත කරනු වන්නට පුළුවන. එවන් අය උත්ථානයක් ලබනු ඇතැයි අපි බලාපොරොත්තු නොවිය යුතුවෙමු. සම්බන්ධ ප්‍රතිපත්ති නොදැන මුළු පෘතුවියේම විනිශ්චය කරුවාණන් ඉදිරියේ පිළිතුරක් දීමට ඔවුන්ට හැකිවෙතැයි බලාපොරොත්තු වන්නේ කෙසේද? ඔවුන්ගේම හැඟීමට, අපමන දෙවියන්වහන්සේ දිනපතා පතිත කරවන ආධාර, උන්වහන්සේගේ පෘතුවිය මත සිටින අය සමඟ සමානව ලබාගෙන ඔවුන් ජීවත්වනවා ඇත. උන්වහන්සේගේ අභිප්‍රාය ගැන දැනුමක් ඇති අය වගකීමක් ඇති තත්වයක් මත තබා "එකිනෙකා තම තමා ගැන දෙවියන්වහන්සේට ගණන් දෙන්නට" නියම කරනවා ඇත. (රෝම 14 : 12)

මෙම වෙන් කිරීම ෆිලික්ස් සමඟ පාවුල් කථා කළ "පැමිණෙන්නාවූ විනිශ්චය" වන අතර විනිශ්චයකරුවාණන් ඔහුගේ යේසුස්වහන්සේමය.

## සාධාරණ විනිශ්චයකරුවාණෝ

විනිශ්චයේ ක්‍රියාව දෙවියන්වහන්සේ විසින් ක්‍රිස්තුස්වහන්සේ සඳහා විශේෂයෙන් වෙන්කර ඇත. උන්වහන්සේ විනිශ්චයකරුවාණෝ වීම කෙතරම් සුදුසුද ! දෙවියන්වහන්සේගේ බලයෙන් පෘතුවියේ මවකගෙන් උපත ලබා, එමගින් අපගේ මනුෂ්‍ය ස්වභාවයට පංගුකාරයෙක් වූසේක. එම ආකාරයෙන්ම පොළඹවීම ලද හෙයින්, අප පැකිලී වැටෙන පෙළඹවීම් උන්වහන්සේ දන්නා සේක. උන්වහන්සේගේ හදවතෙහි "සැමවිටම උන්වහන්සේගේ පියාණන්ගේ මෙහෙය" කිරීමේ අභිප්‍රාය තිබූ නිසා සැම පොළඹවා ගැනීමක්ම යටත් කර ගත්සේක. ආදම්ගේ පෙළපතේ මනුෂ්‍යයෙකු ලෙස උන්වහන්සේ මතට "සැමට සිදුවන එකම ක්‍රියාව" පැමිණි අතර, උන්වහන්සේගේ කීකරුකමේ ජීවිතය නිසා "සොහොනට උන්වහන්සේ දරා සිටිය නොහැකි" වූ අතර, උන්වහන්සේගේ ප්‍රතිහාර්යාත්මක උපත ලබා දුන් බලයම විසින් දෙවියන්වහන්සේ උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටුවා උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම නිසා අමරණීයත්වය දානය කළ සේක.

යෝබ්, යෙසායා, සහ දානියෙල්ට එළිදරව් කළ, මනුෂ්‍යය වර්ගයාගේ සියල්ල යටත්කරගන්නා සතුරාගෙන් මිදීම කළ හැක්කක් බව යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්ථානය තිරණාත්මකව ඔප්පු කළේය. මරණය මත උන්වහන්සේගේ ජයගැනීම නිසා උන්වහන්සේගේ ගෝලයන් හට එම ජයග්‍රහණය බෙදා ගැනීමට සහතිකයක් ඇත. ක්‍රිස්තුස්වහන්සේ ලෙස පූර්ණ කීකරුකමේ ජීවිතයක් ගෙනයාමට මිනිසාට තමන් විසින්ම නොහැකි බැවි දැන, එම ජීවිතයට සම්බන්ධ වීමට සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ගලන්නාවූ ආධාර භුක්තිවිඳීමට පොරොන්දුවක් දෙවියන්වහන්සේ දී ඇත.

මෙම සම්බන්ධතාවය ඉෂ්ටකර ගැනීමට ක්‍රමය නම්, පාප මාර්ග ගැන මනස්තාපවී, සුභාරංචි පණිවුඩයේ සත්‍යය පිළිගත් පදනමක් මත බෞතිස්ම ලැබීමයි.

"ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළට බෞතිස්ම ලැබූවාවූ අප සියල්ලන් උන්වහන්සේගේ මරණයට බෞතිස්ම ලැබූ බව නුඹලා නොදැන සිටින්නහුද? එබැවින් ක්‍රිස්තුස් වහන්සේ පියාණන්වහන්සේගේ මහිමය කරණකොටගෙන මළවුන්ගෙන් නැගිටවනු ලැබුවාසේම අපිත් ජීවනයේ අලුත් කමෙන් හැසිරෙන පිණිස, මරණය තුළට බෞතිස්මය කරණකොටගෙන උන්වහන්සේ සමඟ තැන්පත් කරනු ලැබුවෙමුව. මක්නිසාද උන්වහන්සේගේ මරණයේ සමානත්වයෙන් අපි උන්වහන්සේට සම්බන්ධද වී සිටිමු නම් උන්වහන්සේගේ නැගිටීමේ සමානාත්වයෙනුත් සම්බන්ධ වන්නෙමු." (රෝම 6 : 3-5)

## විශ්වාසවන්ත අනුගමනයේ මිහිරි දීමනාව

විනිශ්චයේ අවශ්‍යතාවය අනවබෝධව යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචි උගැන්වීම් කියවීමට නොහැකිය. උන්වහන්සේගේ ගෝලයන් හට විවෘතව හෝ උපමා කථා ස්වරූපයෙන් තමන්වහන්සේ ශ්‍රවණය කිරීමට පැමිණි සේනාවට හෝ දෙවියන්වහන්සේගේ සේවකයන් හට පැමිණෙන්නාවූ වග උත්තර කීමේ දවසක් ගැන යේසුස්වහන්සේ පැහැදිළිව උගැන්වූ සේක. එක් අවස්ථාවක, රාජ්‍යයක් ලබා ගැනීම සඳහා දුරු රටකට යන වංශවතෙකු ගැන උන්වහන්සේ කථා කළසේක. (තමන්වහන්සේගේ ස්වර්ගාරෝහණයත්, පෘතුවිය මත දෙවියන්වහන්සේගේ රාජ්‍යය පිහිටුවීමට පොරොන්දුවූ නැවත පැමිණීමත් අතර ඇති සමාන්තර භාවය මඟ හැරීමටනොහැක.) ඔහුගේ නැවත පැමිණීමේදී, ඔහු නැති අතර තම සේවකයන් හට දුන් දේවල් පිළිබඳ වාර්තා කිරීමට ඔවුන් කැඳවීය.

විශ්වාසවන්තවූ සේවකයන්ගේ ප්‍රයත්නයන් හට ත්‍යාග දුන් අතර අවිශ්වාසවූ සේවකයන්ගේ විශ්වාස විරහිත භාවයට එම වංශවතා ඔහුට පාවිච්චි කිරීමට දුන් කොටස නැවත ගැනීමෙන් දඬුවම් කළේය. මෙම වාර්තාව මුළුල්ලේම, "විශ්වාසවන්ත" යන වචනය අවධාරණය කොට ඇත. විනිශ්චය කරනු ලබන්නේ දෙවියන්වහන්සේගේ පොරොන්දු තුළ අදහන්නෙකුගේ විශ්වාසයයි. දීමනාවක් උපයාගත් ලෙස විශ්වාසය සාධාරණය කළ හැකි ජීවිතයක් කිසි කෙනෙකු ගෙවා නැත.
යේසුස්වහන්සේම මෙසේ කිසේක:

"නුඹලාට අණකල සියල්ල කළ පසු අපි නිෂ් ප්‍රයෝජන දාසයෝය, අප විසින් කළයුතුව තිබුණු දේ කළෙමුයි කියාපල්ලා" (ලූක් 17:10)

මෙයට අනුකූලව, උපයා ගැනීමට හැකි දෙයක් ලෙස සදාකාල ජීවනයේ පොරොන්දුව විස්තර නොකරත්. ඒ වෙනුවට, එය "දෙවියන් වහන්සේගේ දීමනාවයි" (රෝම 6 : 23) ලබන්නාට නුසුදුසුව, එම දීමනාව කිරීමට හැකිවී තිබෙන්නේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මුදවීමේ ක්‍රියාවෙන්ය.

## විනිශ්චයේ පදනම

පැරණි ගිවිසුමේ මහා චරිතයක්වූ ආබ්‍රහම්, මෙම ප්‍රතිපත්තියේ හොඳ උදාහරණයකි. තමාගේ හැකියාවන් බොහෝ ඉක්මවූ දෑ කිරීමට දෙවියන්වහන්සේ විසින් ඔහු කැඳවා තිබුණි. මෙයින් එකක් වූයේ තම පුත්‍රයාවූ ඊසාක්, බිලි පූජාවක් සේ ඔප්පු කිරීමයි. (උත්පත්ති 22 පරිච්ඡේදය) මෙම සියළු තත්වයන් මධ්‍යයේ අනාගත නැවත නැගිටීමක ඔහු තුළ තිබූ අඛණ්ඩ විශ්වාසයේ හැකියාවට (හෙබ්‍රෙව් 11 : 17-19) ඔහු මහා විශ්වාසයක මනුෂ්‍යයෙකු ලෙස වෙන්කර පෙණුනි. ඔහුගේ විශ්වාසවන්තභාවයේ ප්‍රතිඵලයක් ලෙස දෙවියන්වහන්සේ ඔහු ධර්මිෂ්ඨ මිනිසෙකු ලෙස සැලකූ බැව් වාර්තාවී තිබේ. (රෝම 4 : 3)

ඉදින්, විනිශ්චයේ පදනම මෙයයි. සමහර විට අප උසාවිය සමඟ මෙම වචනය සම්බන්ධ කර, කෙනෙකුගේ ජීවිතයේ නොයෙක් අවස්ථා ගැන සම්බන්ධ හොඳ නරක විවාදයක් සේ මෙය සැලකීමට පෙළඹෙයි. ඒ වෙනුවට එය අසමසම ලෙස සුදුසුකම් ලැබූ, විනිශ්චය ප්‍රකාශ කිරීමට බලය දුන් තැනැත්තා හට දුන් අවස්ථාවක් ලෙස අප සිතිය යුතුය. තීන්දුව වනුයේ ඉෂ්ඨ කළ දෙයෙහි ප්‍රතිඵලය නොවේ. මක්නිසාද එවන් අය නිර්භීතව "ස්වාමීනි, ස්වාමීනි, ඔබගේ නාමයෙන් නොයෙක් බලවත් ක්‍රියා නොකළෙම්ද?යි

කියද්දී ස්වාමීන්වහන්සේ මෙම භයානක පිළිතුර ඔවුන් දෙසට යොමු කරනසේක.

මම කිසි කළෙක නුඹලා නොහැඳින්නෙමි. අධර්මිෂ්ඨකම් කරන්නෙනි, මා කෙරෙන් අහක්ව පලයල්ලා." (මතෙව් 7:22-23)

බොහෝ කලකට පෙර යෙසායා අනාවැකි කියූ ලෙස, දෙවියන්වහන්සේගේ අවශ්‍යතාවය යටහත් සහ සංවේදී සේවකයන්ය. "යටහත්වූ, තැළුණු ආත්මයක් ඇත්තාවූ මාගේ වචනයට වෙව්ලන්නාවූ මනුෂ්‍යයා දෙස බලමි" (යෙසායා 66 : 2) තීන්දුව පාදක වනුයේ කැපවීම මතය, සියළුදේ සඳහා දෙවියන්වහන්සේගේ දයාව මත අප එකිනෙකා සම්පූර්ණයෙන් යැපීම නම් දැනුමයි. එය මේ ජීවිතයේත්, රාජ්‍යය යුගයේ පෘතුවිය මත වගුරුවන්නාවූ ආශිර්වාද සඳහාත්ය.

## මරණයෙන් ජීවිතයට

කෙසේ නමුත් විනිශ්චය, විශ්වාසවන්ත මිනිසුන් සහ ගැහැණුන් මරණයේ සිට ජීවනය දක්වා යොමු කිරීමේ ක්‍රියාවලියේ කොටසක් පමණි. පටන්ගැන්මෙහිදී සිට දෙවියන්වහන්සේගේ අභිප්‍රාය වූයේ මනුෂ්‍යයා උන්වහන්සේගේ ස්වරූපයෙන් සිටීමයි. උන්වහන්සේගේ පුත්‍රයා හට එමනිසා මෙසේ තම ගෝලයන් හට කීමට හැකිවූ සේක. හැකිවන සේක. "මා දුටු තැනැත්තේ පියාණන්වහන්සේ දුටුවේය." (යොහන් 14 : 9) දෙවියන්වහන්සේගේ චරිතයේ පුදුමාකාරය යේසුස්වහන්සේ පරිපූර්ණව විහිදා දැක්වූසේක. උන්වහන්සේ "කරුණාවෙන්ද සත්‍යයෙන්ද පූර්ණ විය" ( 1 : 14) උන්වහන්සේ ශ්‍රවණය කළ බොහෝ දෙනා "උන්වහන්සේගේ මුඛයෙන් නික්මුණු කරුණාවේ වචන ගැන පුදුම වූවෝය." (ලූක් 4 : 22) උන්වහන්සේගේ අභියෝගයෙන් තොර වචන වූයේ "මාර්ගයද, සැබෑවද, ජීවනයද, මමමය" (යොහන් 14 : 6) යන්නයි.

අපගේ චරිත සම්පූර්ණ කිරීමට අප ගන්නා දුර්වල උත්සාහයන් ගෙන් මෙය කොපමණ වෙනස්ද ! විවිධ ආකාරයන්ගෙන් අපි අපම පාලනය කිරීමට නොහැකියාව පෙන්වමු. එක් අයෙකුට එය වංචාල දිවකි. තවත් අයෙකුට එක්තරා අන්දමක ගිජු වීමකි. තවත් අයෙකුට උඩඟු බව නමැති පොදු පාපයයි. විවේචනාත්මක ස්වයං පරීක්ෂණයක ක්‍රියා දාමයක් අප ඇරඹූ විට, ලැයිස්තුවේ අවසානයක් නැත. නමුත් උන්වහන්සේට දිව්‍යමය ස්වභාවයේ පංගුකාරයකු වීම දෙවියන්වහන්සේ පොරොන්දු වී ඇත. විචිත්‍ර භාෂාව යොදා ගනිමින්, මෙම උත්ථානයේ ප්‍රතිඵලයත්, විනිශ්චයේ පිළිගැනීමත් දානියෙල් විස්තර කරයි.

"නුවණ ඇත්තෝ ආකාශයේ දීප්තිය මෙන්ද බොහෝ දෙනෙකු ධර්මිෂ්ඨකමට හරවාගත්තෝ තාරකාවන් මෙන්ද සදාකාලේටම බැබළෙන්නෝය" (දානියෙල් 12 : 3)

"දීප්තිය මෙන්ද" සහ "තාරකාවන් මෙන්ද" ඔවුන් බැබළෙන සැටි සලකා බලන්න. මෙය මරණීය ස්වභාවයේ සිට අමරණීයත්වයට පරිවර්තනයේදී රූපික භාෂාවෙන් කාව්‍යමය විස්තර කිරීමකි. "දෙවියන්වහන්සේ ආලෝකය" යැයි යොහන් පවසයි. "උන්වහන්සේ තුළ කිසිම අන්ධකාරයක් නැත" (1යොහන් 1:5) විනිශ්චයේදී නැගිටුවන ලද සහ පිළිගත් අය එවිට අමරණීය ප්‍රාණීන් ලෙස පරිවර්තනය කිරීමෙන් උන්වහන්සේ කළා සේ උන්වහන්සේගේ ස්වර්ගිය පියාණන්ගේ චරිත ලක්ෂණ විදහා දක්වමින්, ක්‍රිස්තුස්වහන්සේ සමඟ ජීවත්වෙමින් ආණ්ඩු කිරීමක් දානියෙල් අනාවැකි පැවසීය.

සුභාරංචි පණිවිඩයේ දෙන ලද උසස් බලාපොරොත්තුව මෙයයි. ෆිලික්ස් අපහසුවට පත්කළ "පැමිණෙන විනිශ්චය" මගින් එළිදරව් කරන ලද "ධර්මිෂ්ඨභාවයයි., මෙය ඉටුවන්නේ උත්ථානයේ අස්වැන්න එකතු කළ විට පමණි. එම අස්වැන්නේ නැඹුල් ඵලයවූ ක්‍රිස්තුස්වහන්සේ (1කොරින්ති 15:23) මෙම විෂයය ගැන අප සලකා බැලූ සියළු දේ ස්ථිර ලෙසම සිදුවන බවට සහතිකයයි.

## අවස්ථාවේ දවස

මෙම වචන පවසමින් ෆිලික්ස් පාවුල් ඉවතට යැවීය."දැනට පලයන්න. මට ප්‍රස්ථාවක් ලැබුනාම නුඹට අඬගස්වන්නෙමි. (ක්‍රියා 24 : 25) අප කැමති නම්, අපද ඒ දෙයම කරමින් දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ සුභාරංචියට අපගේ පිටුපස හැරවිය හැකිය. අනාගතයේ අපට ප්‍රස්ථාවක් ලැබෙන කාලයක් පැමිණෙන බැව් අප අපටම ඒත්තු ගන්නවා ගත හැකිය. නමුත් අපි වැරදිවන්නෙමු. කොරින්තියේ අදහන්නන් වෙත ලියමින් අපෝස්තුළුවර පාවුල් පැවසූ පරිදි :

දැන් පිළිගත යුතුවූ කාලයය. මෙන්න දැන් ගැළවීමේ දවසයය. (2කොරින්ති 6 : 2)

මේවා ජීවිතයත් මරණයත් අතර දේවල් බැවින් තවත් දවසකට කල් දැමීමට තරම් වටිනාකමින් වැඩිය.

- මයිකල් ඇන්ටන් -

## ප්‍රශ්න

1. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයෝ දේශනාවල බලාපොරොත්තුව කුමක්ද?

2. ධර්මිෂ්ඨ සහ දේවභය සහිත ජීවිත ගත කරන්නන් සඳහා දෙවියන්වහන්සේ දීමනා දෙනබැව් විස්තර කරන බයිබල් පදයක් ලියන්න.

3. දෙවියන්වහන්සේගේ මාර්ග හෝ ධර්මිෂ්ඨ මාර්ග අනුගමනය කිරීම සඳහා අප තුළ තිබිය යුතු ගුණාංග මොනවාද?

4. සියලුදෙනා සඳහා අවසානයේදී පැමිණෙන තත්වය කුමක්ද?

5. මෙම තත්වයෙන් අප නිදහස් කරලීම සඳහා දෙවියන්වහන්සේ පොරොන්දුවන්නේ කෙසේද?

6. මරණයෙන් මුදා ගැනීම පිළිබඳ දෙවියන්වහන්සේගේ පෙරොන්දු රැගත් පැරණි ගිවිසුම් උදාහරණ දෙකක් සපයන්න.

7. බයිබලය එළිදරව් කර ඇති සත්‍යයන් හත මොනවාද? මෙම එක් එක් සත්‍යය සාධනය කිරීම සඳහා බයිබල් පාඨයක් සපයන්න.

8. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නැවත පැමිණීමේදී ජීවත්ව සිටින්නන් හට කුමක් සිදුවේද?

9. යේසුස් වහන්සේ නැවත පැමිණීමේදී මියගිය අය හට කුමක් සිදුවේද?

10. ජීවතුන්ගේත් මළවුන්ගේත් විනිශ්චයකරුවා කවරෙක්ද? කීකරුවූවන් හට ලැබෙන දීමනාව කුමක්ද? අකීකරු වූවන් හට ලැබෙන දඬුවම කුමක්ද?

11. විනිශ්චයේ පදනම කුමක් වනු ඇත්ද? දෙවියන්වහන්සේ ප්‍රසන්න කිරීම සඳහා ඔහු කුමක් කළ යුතුද?